# CONCEPTUAL FRAMEWORK
# OF
# FINANCIAL REPORTING


***S. Madushanka***


***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව

මූල්‍ය ගිණුම්කරණයේ සහ මූල්‍ය ප්‍රකාශනවල කාර්යභාරය හා සීමා නියම කරනු ලබන මූලධර්ම පද්ධතියක් ලෙස මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව හැඳින්විය හැකිය.

එහි සංයුතිය පහත රූප සටහන මගින් දැක්විය හැකිය.




ClassWork LK

# මූල්‍ය ප්‍රකාශවල අරමුණ


පොදු පරමාර්ථ මූල්‍ය වාර්තාකරණයේ අරමුණ වන්නේ වාර්තා කරන ඒකකයක දැනට සිටින හා අපේක්ෂිත ආයෝජකයන්ට, ණය සපයන්නන්ට සහ අනෙකුත් ණයහිමියන්ට එම ඒකකයට අදාළව සම්පත් සැපයීම පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය වන මූල්‍ය තොරතුරු සැපයීමයි.

පොදු පරමාර්ථ මූල්‍ය වාර්තා, වාර්තාකරණ ඒකකයක මූල්‍ය තත්ත්වය, මූල්‍ය ප්‍රතිඵලය හා මූල්‍ය තත්ත්වයේ වෙනස් වීම පිළිබඳ තොරතුරු සපයයි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පදනම් කරගනු ලබන උපකල්පනය වන්නේ අඛණ්ඩ පැවැත්මයි.

ClassWork.LK

# මූල්‍ය තොරතුරු වල ගුණාත්මක ගති ලක්ෂණ




ClassWork.LK

## අදාළ බව

තොරතුරු භාවිත කරන පාර්ශව වල තීරණ වෙනස් කිරීමට මූල්‍ය ප්‍රකාශනවල තොරතුරුවලට හැකියාවක් ඇත්නම් ඒවා අදාළ බවින් යුක්ත වේ.

තොරතුරු අදාළ බවින් යුක්ත වීමට නම් ඒවා පහත අනු ලක්ෂණවලින් යුක්ත විය යුතුය. එනම්,

- පුරෝකථන හැකියාව
- සත්‍යාපනය කළ හැකිවීම
- ප්‍රමාණාත්මක බව

ClassWork.LK

## විශ්වසනීය නියෝජ්‍යත්වය

මූල්‍ය වාර්තා මගින් නිරූපණය කරනු ලබන ආර්ථික සිද්ධීන් විශ්වසනීය නියෝජනයක් නිරූපණය වන පරිදි ඉදිරිපත් කළ යුතු ය.

තොරතුරු විශ්වසනීය ලෙස නිරූපණය කිරීම සඳහා එම තොරතුරු පහත අනු ලක්ෂණාවලින් යුක්ත විය යුතුය.

- සම්පූර්ණ බව
- මධ්‍යස්ථ බව

ClassWork.LK

## සංසන්දනාත්මක බව

ව්‍යාපාර ඒකකයක තොරතුරු එම ඒකකයේ පසුගිය කාලපරිච්ඡේදය සමඟත්, වෙනත් සමාන ව්‍යාපාර ඒකකවල තොරතුරු සමඟත් සංසන්දනය කිරීමට ඇති හැකියාව මින් අදහස් වේ.

## සත්‍යාපනය කළ හැකි බව

මින් අදහස් කරන්නේ ව්‍යාපාර ඒකකයක ගනුදෙනු හා සිද්ධීන් විශ්වසනීය ලෙස ඉදිරිපත් කරන තොරතුරු තුළින් නියෝජනය කර ඇති ද යන්න සනාථ කිරීමට ඇති හැකියාවයි.

## කාලීන බව

තීරණ ගන්නා පාර්ශ්වයන්ට තීරණවලට බලපෑමට සුදුසුවීමට කලට වේලාවට තොරතුරු සැපයීම මින් අදහස් කෙරේ.

## තේරුම්ගත හැකි බව

තොරතුරු භාවිත කරන පාර්ශ්වයන්ට තොරතුරු වර්ග පැහැදිලිව හා සංක්ෂිප්තව දැක්විය යුතු බව මින් අදහස් වේ.

ClassWork.LK

# මූල්‍ය ප්‍රකාශන වල මූලිකාංග

මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංගවලින් දක්වනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශන සමන්වීතව ඇති ආකාරයයි.

මූල්‍ය වාර්තාකරණයේ අරමුණු ළඟා කර ගනු ලබන්නේ මෙම මූලිකාංග තුළින් සපයන තොරතුරු ඇසුරිනි.

මෙම මූලිකාංග ප්‍රධාන වශයෙන් අංග පහකින් (05) සමන්විත වේ. ඒවා නම් :

- වත්කම්
- වගකීම්
- ආදායම්
- වියදම්
- හිමිකම්

ClassWork.LK

## වත්කම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇති වන, ව්‍යාපාරයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති ව්‍යාපාරය විසින් පාලනය කරනු ලබන සම්පතකි.

## වත්කමක තිබිය යුතු මූලික ලක්ෂණ

ඉහත නිර්වචනයට අනුව වත්කමක තිබිය යුතු මූලික ලක්ෂණ 03කි.

- අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමේ හැකියාව
- ව්‍යාපාරය විසින් පාලනයට නතු කිරීම.
- අතීත ගනුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ඇති වීම.

Class Work.LK

# වගකීම්

අතීත සිදුවීමක් තුළින් පැන නගින, ඒවා නිරවුල් කිරීමේ දී ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් ව්‍යාපාරය තුළින් පිටතට ගලා යෑමක් අපේක්ෂා කරන, ව්‍යාපාර ඒකකයක පවතින වර්තමාන බැඳීම වගකීම් ලෙස හැඳින්වේ.

# වගකීමක තිබිය යුතු මූලික ලක්ෂණ

ඉහත නිර්වචනයට අනුව වගකීමක මූලික ලක්ෂණ 03 කි.

1 අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයෙන් පිටතට ගලායෑමේ හව්‍යතාවක් තිබීම.
2 වර්තමාන බැඳීමක් පැවතීම.
3 අතීත ගනුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මෙම බැඳීම ඇති වී තිබීම.

ClassWork.LK

## **හිමිකම්**

ව්‍යාපාරයේ වත්කම්වලින් එහි සියලු වගකීම් අඩු කළ පසු වත්කම්වලට ඉතිරි වන ඇල්මයි.

ඉහත සඳහන් කළ වත්කම්, වගකීම් හා හිමිකම් යන අයිතම ව්‍යාපාර ඒකකයක මූල්‍ය තත්ත්වය මැනීම හා ඍජුව ම සම්බන්ධ වේ.

## **ආදායම්**

ගිණුම් කාලච්ඡේදය තුළ ව්‍යාපාර ඒකකයක් තුළට සම්පත් ගලා ඒමේ හෝ වත්කම් වැඩිකිරීමේ හෝ වගකීම් අඩු කිරීමේ ස්වරූපයෙන් අයිතිකරුවන්ගේ දායකත්වයෙන් තොරව හිමිකම ඉහළ නැංවීමට හේතු වන ආර්ථික ප්‍රතිලාභයන්ගේ වැඩිවීම වේ.

## **වියදම්**

ගිණුම් කාලච්ඡේදය තුළ ව්‍යාපාර ඒකකයක සාමාන්‍ය ක්‍රියාකාරිත්වය තුළින් සම්පත් පිටතට ගලා යෑමෙන් හෝ වතකම් අඩු වීමෙන් හෝ වගකීම් වැඩි වීමේ ස්වරූපයෙන් අයිතිකරුවන්ට කරන බෙදාහැරීම් හැර හිමිකම අඩුවීමට හේතු වන ආර්ථික ප්‍රතිලාභයන්ගේ අඩු වීම වේ.

ClassWork.LK

## මූලිකාංග හඳුනා ගැනීම

මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූලිකාංග හඳුනා ගැනීම සඳහා පහත නිර්ණායක අදාළ කරගත යුතු වේ.

- මූලිකාංග නිර්වචනයට අනුකූල වීම.
- එම අයිතමයට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ඒකකය තුළට ගලා ඒමේ හෝ ඒකකයෙන් ගලා යෑමේ භ්‍යව්‍යතාවක් (හැකියාවක්) තිබිය යුතු වීම.
- එම අයිතමයේ පිරිවැය හෝ වටිනාකම විශ්වසනීය ලෙස මැනිය හැකි වීම.

ClassWork.LK

# මූලිකාංග මැනීම

මූලිකාංග මැනීම යන්නෙන් අදහස් කරන්නේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍යමය වටිනාකම තීරණය කිරීමේ ක්‍රියාවලියයි.

සංකල්පනාත්මක රාමුවට අනුව මූලිකාංග මැනීම සඳහා පහත සඳහන් ක්‍රම භාවිත කළ හැකි වේ.

- ඓතිහාසික පිරිවැය
    - ප්‍රවර්තන පිරිවැය
    - උපලබ්ධි අගය
- වර්තමාන අගය

ClassWork.LK

## අභ්‍යාස

පහත සඳහන් ප්‍රශ්නවලට කෙටියෙන් පිළිතුරු සපයන්න.

1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පදනම් කරගනු ලබන මූලික උපකල්පනය සඳහන් කරන්න.

2 වත්කමක ලක්ෂණ 3ක් හා වගකීමක ලක්ෂණ 3ක් සඳහන් කරන්න.

3 වගකීම් හා හිමිකම් අතර පවත්නා සමානකමක් හා අසමානකමක් සඳහන් කරන්න.

4 මූල්‍ය ප්‍රකාශන තුළ ඇති මූලිකාංග හඳුනා ගැනීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි සඳහන් කරන්න.

5 පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවල පරමාර්ථ හෙවත් අරමුණු සඳහන් කරන්න.

6 මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මිනුම් කිරීම සඳහා යොදා ගන්නා ක්‍රම දෙකක් සඳහන් කරන්න.

7 මූල්‍ය ප්‍රකාශන තොරතුරුවල ඇති මූලික ගුණාත්මක ගතිලක්ෂණ 2ක් සඳහන් කරන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති
(English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura